*සැ. යු.*– 2007.02.09 දින පළවූ අංක 1484 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස හා II කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1485 — 2007 පෙබරවාරි මස 15 වැනි බ්‍රහස්පතින්දා — 2007.02.15**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 114 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 115 |


*සැ. යු.*- කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 දෙසැම්බර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජනවාරි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත් කෙටුම්පත 2007 ජනවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2**. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3**. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5**. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑ කමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**6**. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිළධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

## විභාගාපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## අල්ලස් හෝ දූපණ චෝදනා විමර්ශන කොමිසන් සභාව

### සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු ඇබෑර්තු

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම්පත් මෙයට යා කර ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කර අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මළලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනයට 2007.03.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ “සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර ”යනුවෙන් සඳහන් කළ යුතුය.

01. *වැටුප් ක්‍රමය* :

01.1 මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය
රු. 28,095 - 5 X 645 - 5 X 750 - 35,270 (වැටුප් කේතය - එස්එල් 5)

02. *සුදුසුකම්* :

සෑම අයදුම්කරුවෙකුම -

02.1 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

02.2 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

02.3 2007.03.09 දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

02.4 අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු විය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය* :

03.1 විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03.2 මෙම පත්වීම් කෙරෙනුයේ රාජ්‍ය සේවා කොමිසන් සභාව මගිනි.

04. *සේවා කොන්දේසි* :

04.1 තනතුරට පත්වූ දින සිට වසර තුනක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. (1 පරිශිෂ්ටයෙහි දැක්වේ).

04.2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

04.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලටද ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද, කොමිෂන් සභා නියෝග වලටද රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කළ යුතුය.

04.4 පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. දැනට රජයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරාපත් කරගනු ලැබුවහොත් ඔහු හෝ ඇය එක් අවුරුද්දක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

05. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

06. දැනුම් දීමක් කළවිට අයදුම්කරුවන් පහත සඳහන් සහතික ඉදිරිපත් කළ යුතුය. එහෙත් අයදුම්පත්‍රයට කිසිදු සහතිකයක් අමුණා නොඑවිය යුතුය.

(i.) අධ්‍යාපන සහතික,

(ii.) උප්පැන්න සහතිකය,

(iii.) ජාතික හැඳුනුම්පත,

(iv.) පළපුරුද්ද පිළිබඳ සහතික,

(v.) චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතුය.)

අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවන්ට සෑම අතින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පියසේන රණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
අල්ලස් හෝ දූෂණ චෝදනා
විමර්ශන කොමිෂන් සභාව.

2007 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ 07
මළලසේකර මාවත,
අංක 36,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

*අල්ලස් හෝ දූපණ චෝදනා විමර්පන කොමිපන් සභාව*

සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර

1. (i.) මුලකුරු සමග නම :——————————මහතා/මිය/මෙනවිය
(ii.) සම්පූර්ණ නම:——————————මහතා/මිය/මෙනවිය

2. ලිපිනය :
(i.) පුද්ගලික ලිපිනය:——————————.
(ii.) රාජකාරි ලිපිනය:——————————.
(රාජ්‍ය සේවයේ නියුක්ත නම්)

3. උපන්දිනය :
(i.) අවුරුද්ද:————. මාසය:————. දිනය:————.
(ii.) 2007.03.09 දිනට වයස අවු.:——— . මාස:———. දින:——— .

4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.

5. ජනවර්ගය:——————————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

7. (i.) අධ්‍යාපන සුදුසුකම්:——————————.

(ii.) වෘත්තීය සුදුසුකම්:———————.

(iii.) 2007.03.09 දිනට වෘත්තීය පළපුරුද්ද:
අවු. :— මාස.:— දින:—

8. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධූරය හැරගිය අයකු ලෙස සලකනු ලැබූ කෙනෙක්ද යන වග :———————.

9. (i.) කිසියම් වරදකට දඬුවම් ලබා තිබේද ?:———————.

(ii.) පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර:———————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවරැදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට හේතු වන බවත් පත්කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

———————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්:-

දෙපාර්තමේන්තුව ප්‍රධානියාගේ සහතිකය

..........................................................................................මයා/මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
දෙපාර්තමේන්තුව :—————.
(නිල මුද්‍රාව සහිතව)

පරිශිෂ්ඨය 1

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නිර්දේශ පත්‍රය

කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ඇතුලත් පැය තුනක ප්‍රශ්න පත්‍රයකි (ලකුණු 100කි).

1. ආයතන සංග්‍රහය II,VII,XII,XIII,XVI,XXVIII, XXX, XLVII, XLVIII පරිච්ඡේද,

2. මුදල් රෙගුලාසි I,II,III,IV,V,VI,VII,VIII,IX,X,XI,XII,XIII, XIV පරිච්ඡේද,

3. දෙපාර්තමේන්තු රෙගුලාසි : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂමට අදාල චක්‍රලේඛ උපදෙස් හා රෙගුලාසි,

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුවේ.

02-537

---

## නීතිපති දෙපාර්තමේන්තුව

### තාවකාලික වැඩ බලන රජයේ අධිනීතිඥ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා ඉල්ලුම්පත්‍ර, කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙන් ලබාගත යුතුය.

*වැටුප් පරිමාණය* .– රු. 28,095 (මාසික ස්ථාවර)

*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* .– ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙක් විය යුතුය.

02. ඉල්ලුම්පත්‍ර 2007 පෙබරවාරි මස 28 වෙනි දින අ.භා. 4.00 පෙර ට මෙම දෙපාර්තමේන්තුවට ලැබිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ. සී. කමලසබේසන්,
නීතිපති.

වර්ෂ 2007 ක් වූ පෙබරවාරි මස 02 වැනි දින දී ය.

02 – 557

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ නිලධාරීන් I වන පන්තියට උසස් කිරීමේ විභාගය - 2007

2007 ජනවාරි මස 26 දිනැති අංක 1482 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත විභාග නිවේදනයේ 5.0 ඡේදය යටතේ දැක්වෙන අංක (1) සටහන පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

“(1) අපේක්ෂකයින් තමන් සේවයට ඇතුලු වූ භාෂා මාධ්‍යය හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් මෙම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.”

ඒ. නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 31 වැනි දින,
රාජ්‍ය පරිපාලනය සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

02-582

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ජාතික නැටුම්/සංගීත විභාගය 2006-2007

මෙම විභාගය 2007 මැයි මස පැවැත්වීම සඳහා මවිසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විතය.

02. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් තුළ ම, අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවකදී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් යාබද විභාග මධ්‍යස්ථානය පිහිටි නගරය වෙත යොමු කිරීමට සිදුවනු ඇත. 5.5 ඡේදයේ සඳහන් නගරවල මෙම විභාගය පැවැත්වේ.

03. මෙම විභාගය පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි.

04. මෙම විභාගය පරිගණකගත විභාගයක් බැවින්, ඉල්ලුම්පත් සම්පූර්ණ කිරීමේදී පහත දැක්වෙන ආකෘතියට (ඇමුණුම 1 හෝ 2) අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද, සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *අයදුම්කරුවන්ට උපදෙස් :*

5.1 *සුදුසුකම් :-* සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් විභාගයකදී සිංහල භාෂා විෂයයෙන් සමත්වී සිටිය යුතුය :

(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගය,
(ආ) ජා.පො.අ.ස. විභාගය,
(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය,
(ඈ) ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය.

ඉහත විභාගවලට සමාන හෝ ඉහළ මට්ටමේ හෝ විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් සාමාර්ථය ලබා සිටිය යුතුය.

*සැ.යු.*— 5.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ දී සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

5.2 *වයස් සීමාව :-* 2007.03.15 වන දිනට වයස අවුරුදු 15 සම්පූර්ණ විය යුතු අතර, උපරිම වයස් සීමාවක් නැත. අත්සන සහතික කරන බලධාරියා ලවා උප්පැන්න සහතිකය පරීක්ෂා කරවා නිරවද්‍යතාව සහතික කිරීමට වග බලා ගත යුතුය. නියමිත වයස් සීමාව සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

5.3 *අයදුම්පත්.*— ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන යන විභාග සඳහා අයදුම්කරුවන් තෝරා ගන්නා අනු විෂයය එකක්ම විය යුතු අතර, එය වෙනස් කිරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2007.03.15 වන දිනට හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළින් "ජාතික නැටුම්/සංගීත විභාගය" යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 *අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පෙනී සිටිය යුතු විෂයයන් හා අනෙකුත් විස්තර සඳහා අදාළ ව්‍යවස්ථා හා නිර්දේශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ප්‍රධාන විෂයය හා අනුවිෂයය සඳහා විවිධ වූ විෂය අංක භාවිත වන බැවින් මනා අවධානයෙන් හා සැලකිල්ලෙන් ඇමුණුම 1 හා 2 පරිශීලනය කරමින් ඉතා නිවැරදිව අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු බව අවධාරණය කරමි. තවද ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස, ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය සකස් කරන්න.*

5.5 විභාගය පැවැත්වෙන නගර සහ ඊට අදාළ අංක පහත දැක්වේ:

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | මහනුවර | 10 |
| ගම්පහ | 02 | කෑගල්ල | 11 |
| කළුතර | 03 | මාතලේ | 12 |
| ගාල්ල | 04 | බදුල්ල | 13 |
| මාතර | 05 | අනුරාධපුරය | 14 |
| හම්බන්තොට | 06 | පොළොන්නරුව | 15 |
| රත්නපුර | 07 | කුරුණෑගල | 16 |
| අම්පාර | 08 | කුලියාපිටිය | 17 |
| මොණරාගල | 09 | | |

5.6 *විභාග ගාස්තු :-* මෙම ලිඛිත විභාගයේ විභාග ගාස්තු පහත සඳහන් පරිදි වේ:

1. ප්‍රාරම්භ - රු. 250
2. මධ්‍යම - රු. 300
3. අවසාන - රු. 350

අදාළ විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල් නමින් දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි අතර, එසේ මුදල් ගෙවා ලබාගන්නා ලද ලදුපත සෑම අයදුම්කරුවෙකු විසින්ම අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු නොගෙවන අතර, එම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. නියමිත ගාස්තු නොගෙවීමෙන් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප වේ. මුදල් ගෙවා ලබාගන්නා ලදුපතේ හා අයදුම්පත්‍රයේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.7 *ප්‍රවේශ පත්‍ර :*

1. අයදුම්පතේ සඳහන් ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කර යවනු ලැබේ.

2. විභාග දිනයට සතියකට කලින්වත් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණු අයදුම්කරුවෙකු වේනොත් පහත සඳහන් තොරතුරු මා වෙත දැන්විය යුතුය.

1. විභාගයේ නම - ප්‍රාරම්භ ද/මධ්‍යම ද/අවසාන ද යන්න
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :—
3. අයදුම්කරුගේ සම්පූර්ණ ලිපිනය :—
4. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගරය/අංකය :—
5. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් :—
6. අයදුම්පතෙහි ඡායා පිටපතක් :—

5.8 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ අයදුම්කරුවන් විසින් සපයාගත යුතුය.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2006 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
පැලවත්ත,
බත්තරමුල්ල.

*ඇමුණුම 1*

## ජාතික නැටුම් විභාගය

*නැටුම් - විෂය ලේඛනය හා විෂය අංක*

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| *(අ)* ප්‍රධාන විෂයය | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| සබරගමු නැටුම් | 110 | 210 | 310 |
| පහතරට නැටුම් | 120 | 220 | 320 |
| උඩරට නැටුම් | 130 | 230 | 330 |
| බෙර වාදනය | | | |
| පහතරට බෙර වාදනය | 140 | 240 | 340 |
| උඩරට බෙර වාදනය | 150 | 250 | 350 |
| *(ආ)* අනුවිෂයය | | | |
| සංගීතය | 112 | 212 | 312 |
| බෙර වාදනය | | | |
| සබරගමු හේවිසි වාදනය | 113 | 213 | 313 |
| පහතරට බෙර වාදනය | 141 | 241 | 341 |
| උඩරට බෙර වාදනය | 151 | 251 | 351 |
| ජන ගායනා | 114 | 214 | 314 |
| භාරතීය නැටුම් | | | |
| කතක් | 115 | 215 | 315 |
| කතකලී | 116 | 216 | 316 |
| මනිපූරි | 117 | 217 | 317 |
| භරත | 118 | 218 | 318 |
| සාම්ප්‍රදායික නැටුම් | | | |
| සබරගමු නැටුම් | 111 | 211 | 311 |
| පහතරට නැටුම් | 121 | 221 | 321 |
| උඩරට නැටුම් | 131 | 231 | 331 |
| නිර්මාණ | 119 | 219 | 319 |
| ශාස්ත්‍රීය අවබෝධය | | | |
| නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම | 122 | 222 | 322 |
| සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 | | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ජාතික නැටුම් විභාගය 2006-2007 "D"

නැටුම්

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය — අකුරින් — ඉංග්‍රීසි සංකේත අක්ෂරය
ප්‍රාරම්භ-P මධ්‍යම-M අවසාන-F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

| ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්) | එහි අංකය |
|---|---|
| | |

1. *(අ)* සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න)

*(ආ)* මුලකුරු අගට යොදා මුලකුරු සමග නම:-
උදා: SILVA, A.B.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න)

3. ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී - 1 පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම්කරන විෂයයන් හා විෂයය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න:
(*ගැසට් නිවේදනයේ* ඇමුණුම 1 බලන්න)

ප්‍රධාන විෂයය

| *විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

අනුවිෂයය

| *විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.:
(*ගැසට් නිවේදනයේ* 05 වන ඡේදය බලන්න.)

7. සමත්වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන පිළිබඳ විස්තර :

| | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

8. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථය ලැබූ විභාගය පිළිබඳ විස්තර :

1. වර්ෂය: [ ]

2. විභාග අංකය: [ ]

3. ඌන සාමාර්ථය ලත් විභාගය : [ ]

4. ඌන සාමාර්ථය ලත් අනුවිෂයය (ප්‍රායෝගික) අංකය: [ ]
(මෙහි ඇතුළත් ඇමුණුම 1 ලේඛනයේ සඳහන් විෂයය අංකය ම සඳහන් කරන්න.)

9. *(අ)* උපන් දිනය :

අවුරුද්ද: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

*(ආ)*2007.03.15 වන දිනට වයස :

අවුරුදු: [ | ] මාස: [ | ] දින: [ | ]

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

10. ගෙවන ලද විභාග ගාස්තු වචනයෙන් රු. : ——————————.
(ඉලක්කමෙන් රු.: ——————————.)

විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය : ——————.

තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය : —————.

දිනය: —————.

(මුද්දර අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත)

11. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් රිසිට් පත නොගැලවෙන සේ සම්පූර්ණයෙන් අලවන්න.

[ රිසිට් පත මෙහි අලවන්න. ]

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබාගන්න)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගයට සම්බන්ධ නීති රීතිවලට මම එකඟ වෙමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු ———————————— දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් තබන ලද බවද, ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .............................. බවද, 200............... දිනට වයස අවුරුදු 15 ට වැඩි බවද සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න)

අත්සන සහතික කරන අයගේ නම : ——————————.
තරාතිරම : ——————————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)
ලිපිනය : ——————————.

————————————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ——————————.

*සැලකිය යුතුයි.-* (අත්සන සහතික කිරීම අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු, රජයේ හෝ පළාත් පාලන සේවාවක වාර්ෂිකව රුපියල් 348,360 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන කෙනෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

*ඇමුණුම 2*

## ජාතික සංගීත විභාගය

### සංගීතය - විෂයය ලේඛනය හා විෂයය අංක

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| *(අ)* ප්‍රධාන විෂයය : | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| ගායනය | 160 | 260 | 360 |
| වාදනය | | | |
| වයලීනය | 171 | 271 | 371 |
| එස්රාජය | 172 | 272 | 372 |
| තබ්ලාව | 173 | 273 | 373 |
| සරෝජය | 174 | 274 | 374 |
| සිතාරය | 175 | 275 | 375 |
| බටනලාව | 176 | 276 | 376 |
| සාරංගීය | 177 | 277 | 377 |
| ගිටාරය | 178 | 278 | 378 |
| තබ්ලාව | 190 | 290 | 390 |
| *(ආ)* අනු විෂය : | | | |
| ගායනය | 161 | 261 | 361 |
| වාදනය | | | |
| වයලීනය | 181 | 281 | 381 |
| එස්රාජය | 182 | 282 | 382 |
| තබ්ලාව | 183 | 283 | 383 |
| සරෝජය | 184 | 284 | 384 |
| සිතාරය | 185 | 285 | 385 |
| බටනලාව | 186 | 286 | 386 |
| සාරංගීය | 187 | 287 | 387 |
| ගිටාරය | 188 | 288 | 388 |
| තබ්ලාව | 191 | 291 | 391 |
| සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 | | |

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ජාතික සංගීත විභාගය 2006-2007 "M"

සංගීතය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය : අකුරින් ඉංග්‍රීසි සංකේත අක්ෂරය
ප්‍රාරම්භ -P මධ්‍යම-M අවසාන-F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

| ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්) | එහි අංකය |
|---|---|
| | |

1. *(අ)* සම්පූර්ණ නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න)

*(ආ)* මුලකුරු අගට යොදා
මුලකුරු සමග නම:-
උදා : SILVA, A.B. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න)

3. ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී - 1, පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :-

5. ඉල්ලුම්කරන විෂයයන් හා විෂයය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න (*ගැසට් නිවේදනයේ* ඇමුණුම 1 බලන්න)

ප්‍රධාන විෂයය

| විෂයයේ නම | විෂයය අංකය |
|---|---|
| | |

අනු විෂයය

| විෂයයේ නම | විෂයය අංකය |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(*ගැසට් නිවේදනයේ* 05 වන ඡේදය බලන්න.)

7. සමත්වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන පිළිබඳ විස්තර :

| | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

8. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථය ලැබූ විභාගය පිළිබඳ විස්තර :

1. වර්ෂය :
2. විභාග අංකය :
3. ඌන සාමාර්ථය ලත් විභාගය:
4. ඌන සාමාර්ථය ලත් අනුවිෂයය (ප්‍රායෝගික) අංකය:
(මෙහි ඇතුළත් ඇමුණුම 1 ලේඛනයේ සඳහන් විෂයය අංකය ම සඳහන් කරන්න.)

9. *(අ)* උපන් දිනය :

අවුරුද්ද : මාසය : දිනය :

*(ආ)* 2007.03.15 වන දිනට වයස:-

අවුරුදු : මාස: දින :

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

10. ගෙවන ලද විභාග ගාස්තු වචනයෙන් රු. : ————.
(ඉලක්කමෙන් රු.: ————.)

විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය : ————.

තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය : ————.

දිනය: ————.

(මුද්දර අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත)

11. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් රිසිට් පත නොගැලවෙන සේ සම්පූර්ණයෙන් අලවන්න.

රිසිට් පත මෙහි අලවන්න.

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබාගන්න)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගයට සම්බන්ධ නීති රීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු ................................ දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් තබන ලද බවද, ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .............. බවද, 200.............. දිනට වයස අවුරුදු 15 ට වැඩි බවද සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න)

අත්සන් සහතික කරන අයගේ නම : ————.

තරාතිරම : ————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)

ලිපිනය : ————.

————.
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ————.

*සැලකිය යුතුයි.-* (අත්සන සහතික කිරීම අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු,රජයේ හෝ පළාත් පාලන සේවාවක වාර්ෂිකව රුපියල් 348,360 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන කෙනෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

02-465

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.